**මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කිරීමට නියමිත ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවා සපයා ගැනීම**

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කිරීමට නියමිත ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල සඳහා ගුරුවරියක් වශයෙන් සේවය සැපයීමට උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල් ගුරු නාමය සඳහන් කර **2023.12.15** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. මිල දී ගැනීමට නියමිත සේවාව : පෙර පාසල් ගුරු සේවය ඉංග්‍රීසි මාධ්‍ය (කොන්ත්‍රාත් පදනම මත)

2. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3. දෛනික දීමනාව : දිනකට රු. 1,400.00 බැගින්

4. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් සමත් වීම;

*හා*

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත් වී තිබීම.

* ***සටහන.***- එම විභාගයන්හි දී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්ය විෂයයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

5. වෘත්තීය සුදුසුකම් : පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව ;

*හෝ*

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

*හෝ*

මධ්‍යම පළාත් සභාවේ, මුල් ළමාවිය සංවර්ධන ඒකකය මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

*හෝ*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව.

* ***සටහන.***- මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි විය යුතුය.

6. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ii) පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත කාන්තා අයදුම්කාරියන් පමණක් අයදුම් කළ යුතුය.

(iii) අයදුම්කාරියන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) සේවය ලබා ගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයදුම්කාරියන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත් ව තෝරා ගනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවය ලබා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

6. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් වසරක කාලයක් සඳහා තෝරා ගනු ලැබේ.

7. මෙම බඳවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු නිත්‍ය තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

මෙම තනතුර සඳහා වන අයදුම්පත මහනුවර මහා නගර සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ, නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු ය.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින.

11-591/2